අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2009 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2009

ඉතිහාසය I කොටස
History Part I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා**

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

○ අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් ද'යි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

01. (1) ජානකීහරණය (2) සියබස්ලකර (3) බුදුගුණඅලංකාරය
(4) සිඛවළඳ විනිස (5) සමන්තපාසාදිකා (......)

02. (1) මින්නේරිය වැව (2) කන්තලේ වැව (3) හුරුළු වැව
(4) මහකනදරා වැව (5) මාමිනියාව වැව (......)

03. (1) සෝමාදේවී (2) රත්නාවලී (3) තිලෝකසුන්දරී
(4) කල්‍යාණවතී (5) ලීලාවතී (......)

04. (1) චුණ්ණගාම (2) පලුට්ඨගිරි (3) වාකිරිගල
(4) විජිතගාම (5) මහානාගහුල (......)

05. (1) ආලාහන පිරිවෙන (2) මයුරපාද පිරිවෙන (3) විජයබා පිරිවෙන
(4) සුනේත්‍රාදේවී පිරිවෙන (5) පද්මාවතී පිරිවෙන (......)

06. (1) පරරාජශේඛරම් (2) සංකිලි (3) පුවිරාජ පණ්ඩරම්
(4) අරිට්ඨ කී වේන්ඩු පෙරුමාල් (5) එදිරිමානසිංහම් (......)

07. (1) ලොරෙන්සෝ ද අල්මේදා (2) පේරෝ ලෝපේස් ද සූසා (3) දොන් ජේරනිමෝ ද අසවේදු
(4) කොන්ස්තන්තීනු ද සා නොරොඤ්ඤා (5) දියොගෝ ද මේලෝ ද කස්ත්‍රෝ (......)

08. (1) අදිකාරම් (2) දිසාව (3) වාසල මුදලි
(4) කෝරාළ (5) අතුකෝරාළ (......)

09. (1) ජෝන් ඩොයිලි (2) ජෝර්ජ් ටර්නර් (3) ජෝර්ජ් බර්ඩ්
(4) ජේම්ස් එමර්සන් ටෙනන්ට් (5) ලෙනාර්ඩ් වුල්ෆ් (......)

10. (1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2) වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි (3) වැලිවිට ශ්‍රී සරණංකර හිමි
(4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (5) රත්මලානේ ධම්මාලෝක හිමි (......)

○ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක් ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියන්න.**

11. (1) බෝවත්තෙගල සෙල්ලිපිය - ප්‍රාදේශීය රජ පෙළපතක් පිළිබඳ තොරතුරු
(2) කුච්චවේලි සෙල්ලිපිය - මහායාන අදහස් සඳහන් වේ.
(3) ගොඩවාය සෙල්ලිපිය - වරාය බදු
(4) තිරියාය සෙල්ලිපිය - ග්‍රාම පාලනය ගැන
(5) හෝපිටිගම සෙල්ලිපිය - වෙළඳපළ පරිපාලනය පිළිබඳ නීති (......)

Past Papers Wiki

12. (1) විශුද්ධිමග්ග - මහානාම හිමි
(2) නිකාය සංග්‍රහය - දේවරක්ඛිත ජයබාහු ධම්මකිත්ති හිමි
(3) සිංහල බෝධිවංශය - විල්ගම්මුල හිමි
(4) සාරාර්ථ සංග්‍රහය - බුද්ධදාස රජු
(5) ධම්පියා අටුවා ගැටපදය - පස්වැනි කාශ්‍යප රජු (......)

13. (1) මහවැලි ගඟ - ත්‍රිකුණාමලය
(2) වලවේ ගඟ - අම්බලන්තොට
(3) මැණික් ගඟ - කිරින්ද
(4) නිල්වලා ගඟ - ගාල්ල
(5) දැදුරු ඔය - හලාවත (......)

14. (1) රොබට් නොක්ස් - එදා හෙළදිව
(2) ජුවාන් රිබෙයිරෝ - ලංකාවේ පනස් වසරක්
(3) පර්නාවෝ ද ක්වේරෝස් - ලංකාවේ දේශපාලන හා ආධ්‍යාත්මික ආධිපත්‍යය
(4) එමර්සන් ටෙනන්ට් - ලංකාව
(5) එච්. සී. පී. බෙල් - කෑගල්ල වාර්තාව (......)

15. (1) පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
(2) එන්. එම්. පෙරේරා - ලංකා සමසමාජ පක්ෂය
(3) ඩී. බී. ජයතිලක - සිංහල මහ සභාව
(4) ජී. ජී. පොන්නම්බලම් - ද්‍රවිඩ සංගමය
(5) ඒ. ඊ. ගුණසිංහ - කම්කරු පක්ෂය (......)

○ අංක 16 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. X තීරුව, Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. **නිවැරදි** සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) කදම්බ නදී | A මහවැලි ගඟ |
| (ii) ගෝණ නදී | B මල්වතු ඔය |
| (iii) කප්පරකන්දර නදී | C දැදුරු ඔය |
| (iv) ජජ්ජර නදී | D මැණික් ගඟ |
| (v) මහාවාලුකා නදී | E කලා ඔය |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

17.

| X | Y |
|---|---|
| (i) කොට වෙහෙර | A ත්‍රිකුණාමලය |
| (ii) ථූපාරාම දාගැබ | B දැදිගම |
| (iii) කණ්ඨක චේතිය | C මිහින්තලය |
| (iv) තිවංක පිළිමගේ | D අනුරාධපුර |
| (v) තිරුකෝනේශ්වරම් කෝවිල | E පොළොන්නරුව |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

18.

| X | Y |
|---|---|
| (i) ටොලමි | A රෝමයට ගිය ශ්‍රී ලංකා දූත මෙහෙවර ගැන වාර්තාව |
| (ii) ප්ලිනි | B ශ්‍රී ලංකාව දැක්වෙන ප්‍රථම භූ සිතියම |
| (iii) පාහියන් | C ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා බාහිර වෙළඳාම පිළිබඳ විස්තර |
| (iv) ඉබන් බතූතා | D යාපන රාජ්‍යය පිළිබඳ විස්තර |
| (v) කොස්මස් | E අභයගිරි විහාරය පිළිබඳ විස්තර |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කුරුවේ බද්ද | A | ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| (ii) | මඩිගේ බද්ද | B | අලි ඇතුන් පිළිබඳ දෙපාර්තමේන්තුව |
| (iii) | මහ බද්ද | C | වියන්නන් පිළිබඳ කාර්යාංශය |
| (iv) | කොට්ටල් බද්ද | D | කුරුඳු දෙපාර්තමේන්තුව |
| (v) | කිත්තර බද්ද | E | ශිල්පීන් පිළිබඳ දෙපාර්තමේන්තුව |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කෝකිල සන්දේශය | A | අලගියවන්න මුකවෙටි |
| (ii) | සැලළිහිණි සන්දේශය | B | ඉරුගල් කුලතිලක හිමි |
| (iii) | ගුත්තිල කාව්‍යය | C | වීදාගම මෛත්‍රීය හිමි |
| (iv) | ලෝවැඩ සඟරාව | D | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| (v) | සුභාෂිතය | E | වැත්තෑවේ හිමි |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

21.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වළගම්බා | A | ධර්මපාල |
| (ii) | ධාතුසේන | B | බල්ලාටනාග |
| (iii) | I විජයබාහු | C | සමුද්‍ර දේවි |
| (iv) | වීදිය බණ්ඩාර | D | මුගලන් |
| (v) | VII බුවනෙකබාහු | E | මිත්තා |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

22.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ෆ්‍රෙඩ්රික් බලකොටුව | A | මාතර |
| (ii) | තාරකා බලකොටුව | B | කොටදෙණිය |
| (iii) | මැක්ඩෝවල් බලකොටුව | C | ත්‍රිකුණාමලය |
| (iv) | මැක්ඩොනල්ඩ් බලකොටුව | D | මාතලේ |
| (v) | ඔස්ටන්බර්ග් බලකොටුව | E | බදුල්ල |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

23.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ෆ්‍රෙඩ්රික් නෝර්ත් | A | මහනගර සභා පිහිටුවීම. |
| (ii) | රොබට් බ්‍රවුන්රිග් | B | ලංකා සිවිල් සේවය ආරම්භ කිරීම. |
| (iii) | එඩ්වඩ් බාන්ස් | C | ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම. |
| (iv) | විල්මට් හෝර්ටන් | D | කොළඹ-මහනුවර මාර්ගය ඉදිකිරීම. |
| (v) | හර්කියුලිස් රොබින්සන් | E | මහනුවර රාජධානිය බ්‍රිතාන්‍යයන් විසින් අඳා ගැනීම. |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

24.

| | X | | Y |
|---|---|---|---|
| (i) | 1797 - 1798 කැරැල්ල | A | හජ්ජි මරික්කාර් මුහන්දිරම් තනතුරට පත්කිරීම. |
| (ii) | 1818 නිදහස් අරගලය | B | පොල්ගස්වලින් බදු අයකිරීම. |
| (iii) | 1848 මාතලේ සටන | C | වල්ලහගොඩ දේවාල පෙරහැරට අවහිරතා ඇති කිරීම. |
| (iv) | 1883 කොටහේන කෝලාහලය | D | බෞද්ධ පෙරහැරකට පහරදීම. |
| (v) | 1915 කෝලාහලය | E | අලුත් බදු පැනවීම. |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

Past Papers Wiki

| | X | | Y |
|---|---|---|---|
| 25. (i) | 1802 | A | සමුපකාර දෙපාර්තමේන්තුව පිහිටුවීම. |
| (ii) | 1867 | B | මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිහිටුවීම. |
| (iii) | 1900 | C | වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම. |
| (iv) | 1912 | D | ප්‍රසිද්ධ ඉංජිනේරු දෙපාර්තමේන්තුව පිහිටුවීම. |
| (v) | 1930 | E | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම. |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

○ අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .................................... 1 ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .................................... 2 ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .................................... 3 ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .................................... 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... 5 ද, **තිත් ඉර මත ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

26. **ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ශ්‍රී ලංකාවේ මුල් ජනපද පිහිටු වූ ආර්යයන් වයඹදිග ඉන්දියාවෙන් පැමිණියේයැ යි විශ්වාස කෙරේ.
(B) ආර්යාගමනයට පෙර පවා ශ්‍රී ලංකාව සීහලදීප නමින් හඳුන්වනු ලැබී ය.
(C) පාහියන්ගේ වාර්තාවට අනුව මුල් ජනපදිකයින් සිංහල නමින් හැඳින්වුණු නායකයකු යටතේ පැමිණි වෙළඳ කණ්ඩායමකි.
(D) විජය සහ ඔහුගේ පිරිස ගෝකණ්ණට ගොඩබට බව කිය වේ. (......)

27. **රෝහණ රාජ්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) දේවානම්පිය තිස්ස රජුගේ බාල සොයුරු මහානාග මාගම සිට රුහුණ පාලනය කළේ ය.
(B) කාවන්තිස්ස රජු දශභාතිකයන් පරාජය කොට ගෝඨාභය රෝහණ රාජ්‍යයේ ප්‍රදේශ ව්‍යාප්ත කළේ ය.
(C) දුටුගැමුණු කුමාරයා සේරු, සෝම හා ලෝණ යන ප්‍රාදේශීය රාජ්‍ය ඈඳාගනිමින් රෝහණය ව්‍යාප්ත කළේ ය.
(D) කුසලාන්කන්ද සෙල්ලිපියේ දුටුගැමුණු රජුගේ දසමහා යෝධයන්ගේ නම් සඳහන් වේ. (......)

28. **සීතාවක රාජධානිය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) සීතාවක රාජධානියේ පළමුවන පාලකයා මායාදුන්නේ රජු ය.
(B) I රාජසිංහ රජු විසින් උඩරට, සීතාවක රාජධානියට ඈඳා ගනු ලැබී ය.
(C) මුල්ලේරියා සටනේ දී රාජසිංහ කුමාරයා විසින් 1562 දී පෘතුගීසීහු පරාජයට පත් කරන ලදී.
(D) මායාදුන්නේ රජු ශිව ආගම වැළඳගෙන බැරැන්ඩි කෝවිල ඉදිකළේ ය. (......)

29. **උඩරට රාජධානියේ නායක්කර් රජවරුන් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) නායක්කර් රජවරු සීතාවක රජවරුන් සමඟ විවාහ සම්බන්ධතා පවත්වාගෙන ගියහ.
(B) නායක්කර් වංශයේ පළමුවන පාලකයා විජය රාජසිංහ රජු ය.
(C) 1760 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඝාතනය කිරීම සඳහා අසාර්ථක කුමන්ත්‍රණයක් සිදුවිය.
(D) නායක්කර් වංශයේ අවසන් පාලකයා වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ය. (......)

30. **සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදි වේ ද?**
(A) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා ක්‍රමය දිගට ම පවත්වා ගැනිණ.
(B) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පළමුවන පාර්ලිමේන්තු මැතිවරණය 1948 දී පැවැත්වී ය.
(C) මෙම ව්‍යවස්ථාව යටතේ ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කරන ලදී.
(D) මෙම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කෙරිණි. (......)

○ අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ. එම නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

31. **රජරට ශිෂ්ටාචාර සමයේ චිත්‍ර කලාව**
    (1) සීගිරි චිත්‍ර ක්‍රි.ව. 5 සිට 7 දක්වා සියවස්වලට අයත් වේ.
    (2) තිවංක පිළිමගෙහි චිත්‍ර පොළොන්නරු යුගයට අයත් වේ.
    (3) ස්තූපවල ධාතු ගර්භ ඇතුළත බිත්තිවල චිත්‍ර ඇඳීම පැරණි ශ්‍රී ලංකාවේ බෞද්ධයින් අතර පැවති සම්ප්‍රදායකි.
    (4) හිඳගල චිත්‍ර පොළොන්නරු යුගයට අයත් ය.
    (5) දිඹුලාගල (මාරා විදිය) චිත්‍රවලින් සස ජාතකය නිරූපණය කෙරෙයි. (......)

32. **නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග**
    (1) සිහසුනට පාණ්ඩ්‍ය වංශිකයන් උරුමකම් ඉදිරිපත් කිරීම.
    (2) ගොවි කුලයේ විරෝධතා
    (3) පරාක්‍රමබාහු රජුගේ කීර්තිනාමය
    (4) නිශ්ශංකමල්ලගේ කාලිංග ප්‍රභවය
    (5) චෝළ ආක්‍රමණය (......)

33. **ගම්පොළ රාජධානිය**
    (1) කෝකිල සන්දේශය රචනා කරන ලද්දේ ගම්පොළ යුගයේ දී ය.
    (2) සේනාධිලංකාර සහ අලගක්කෝනාර මෙම අවධියේ සිට ප්‍රධාන ප්‍රභූ පවුල් දෙක විය.
    (3) ආර්යචක්‍රවර්තීන් ගම්පොළ රාජ්‍යයට අයත් ප්‍රදේශ ආක්‍රමණය කළ බවට සාධක ඇත.
    (4) මැදවලින් හා ලංකාතිලකයෙන් හමු වූ සෙල්ලිපි මෙම යුගයට අයත් වේ.
    (5) ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරය ගනේශ්වරාචාර්ය විසින් ඉදිකරන ලදී. (......)

34. **1815 උඩරට ගිවිසුම**
    (1) මෙම ගිවිසුමේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වූයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා සහ උඩරට රදල ප්‍රභූන් ය.
    (2) බුද්ධාගමට රාජ්‍ය ආරක්ෂාව සැපයීමට ගිවිසුමේ 5 වන වගන්තියෙන් බ්‍රිතාන්‍යයෝ පොරොන්දු වූහ.
    (3) ඇහැලේපොල මහාදිකාරම් තනතුරට පත්කරන ලදී.
    (4) ගිවිසුම සකස් කිරීමේ ලා පුරෝගාමී වූයේ ජෝන් ඩොයිලි ය.
    (5) නායක්කර්වරුන්ට උඩරට සිහසුනට තිබූ අයිතිය මෙම ගිවිසුමෙන් අහෝසි කෙරිණ. (......)

35. **දහනව වන සියවසේ දේශීය කෘෂිකර්මය**
    (1) 1848 විමුක්ති අරගලයෙන් අනතුරුව වෝඩ් ආණ්ඩුකාරයා විසින් දේශීය කෘෂිකර්මය නගාසිටුවීමට පියවර ගන්නා ලදී.
    (2) දේශීය කෘෂිකර්මය නගාසිටුවීම සම්බන්ධයෙන් ගනු ලැබූ වැදගත් පියවරක් වූයේ වියළි කලාපයේ පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ය.
    (3) හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරයා විසින් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කරන ලදී.
    (4) ගම්සභා ක්‍රමය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ එක් අරමුණක් වූයේ දේශීය කෘෂිකර්මය නගාසිටුවීමයි.
    (5) මෙම අවධියේ දී පැරණි වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ලා හෙන්රි වෝඩ්, විලියම් ග්‍රෙගරි සහ ආර්තර් ගෝර්ඩන් යන ආණ්ඩුකාරවරු පුරෝගාමී වූහ. (......)

○ අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1,2,3,4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

PAST PAPERS WIKI

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | පණ්ඩුකාභය රජු සිය අගනගරය ලෙස අනුරාධපුරය ස්ථාපිත කළේ ය. | දේවානම්පිය තිස්ස රජු අනුරාධපුර නගරය වටා ආරක්ෂක පවුරක් ඉදි කළේ ය. | (.......) |
| 37. | උඩරට රාජධානියේ ආර්ථිකයේ පදනම වූයේ යැපුම් කෘෂිකර්මයයි. | උඩරට රජවරුන්ගේ මූල්‍ය ආදායම ඉතා සීමිත විය. කාසි භාවිතය දුර්ලභ වූ අතර විනිමය මාධ්‍යයක් ලෙස නිරන්තරයෙන් වී භාවිත විය. ඒ අතර, බොහෝ ආර්ථික ගනුදෙනු භාණ්ඩ හුවමාරුව මත පදනම් ව පැවතිණි. | (.......) |
| 38. | ශ්‍රී ලංකාවේ පළමුවන ලන්දේසි ආණ්ඩුකාරයා රයික්ලොප් ෆන් හූන්ස් ය. | ශ්‍රී ලංකාවේ අන්තිම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා හෙන්රි මන්ක් මේසන් මූවර් ය. | (.......) |
| 39. | ද්විත්ව පාලනය යනු 1798 සිට 1802 දක්වා ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් වල ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් හවුලේ ක්‍රියාත්මක කරන ලද පාලන ක්‍රමයයි. | 1833 දී ශ්‍රී ලංකාව කිරීටයේ යටත් විජිතයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබී ය. | (.......) |
| 40. | ශ්‍රී ලංකාවේ අමරපුර නිකාය පිහිටුවන ලද්දේ 1802 දී ය. | වෙස්ලියන් මිෂනාරීන් ශ්‍රී ලංකාවට පැමිණියේ පෘතුගීසි අනුග්‍රහය යටතේ ය. | (.......) |

PAST PAPERS WIKI

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2009 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2009

| ඉතිහාසය I කොටස<br>History Part I | ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා | පැය දෙකයි<br>Two Hours |
|---|---|---|

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

## II කොටස

01. අනුරාධපුර යුගයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී පාලි වංශකථාවලින් ලැබෙන තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් හෙළිවන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 14 යි)**

02. මහින්දාගමනය හුදෙක් නව ආගමක් හඳුන්වා දුන්නා පමණක් නොව ශ්‍රී ලාංකික සංස්කෘතිය පෝෂණයට ද ඉවහල් විය.
   (i) මහින්දාගමනය සිදු වූයේ කීවෙනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ද? **(ලකුණු 01 යි)**
   (ii) එම සංගායනාවේ ප්‍රධානත්වය දැරූ තෙරුන් වහන්සේ නම් කරන්න. **(ලකුණු 01 යි)**
   (iii) මහින්දාගමනය සිදු වූ අවධියේ ශ්‍රී ලංකාවේ පැවැති ආගමික විශ්වාස හා ඇදහිලි සැකෙවින් දක්වන්න. **(ලකුණු 04 යි)**
   (iv) මහින්දාගමනය ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ඇතිකළ බලපෑම් කෙරෙහි අවධානය යොමුකරමින් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. **(ලකුණු 08 යි)**

03. (i) වට්ටගාමණී අභය රජුට මුහුණදීමට සිදු වූ අභියෝග කවරේ ද? **(ලකුණු 07 යි)**
   (ii) ඔහු එම අභියෝග ජයගත් අයුරු පැහැදිලි කරන්න. **(ලකුණු 07 යි)**

04. මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා විචාරාත්මක ව විමසන්න. **(ලකුණු 14 යි)**

05. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය අගය කරන්න. **(ලකුණු 14 යි)**

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් අනුගමනය කළ ආගමික හා ආර්ථික ප්‍රතිපත්ති පරීක්ෂා කරන්න. **(ලකුණු 14 යි)**

07. "උඩරට ස්වාධීන රාජ්‍යයක් ස්ථාපනය කිරීමේ ලා පළමුවැනි විමලධර්මසූරිය රජු පුරෝගාමී විය."
   (i) රජවීමට පෙර පළමුවන විමලධර්මසූරිය හැඳින්වූයේ කුමන නමකින් ද? **(ලකුණු 01 යි)**
   (ii) ඔහුගේ අගබිසවගේ නම කුමක් ද? **(ලකුණු 01 යි)**
   (iii) ආගමික අංශයෙන් ඔහුගෙන් සිදු වූ සේවා **දෙකක්** නම් කරන්න. **(ලකුණු 01 යි)**
   (iv) පළමුවැනි විමලධර්මසූරිය රජුගේ සිහසුනට ඇති අයිතිය තහවුරු කිරීමෙහි ලා දන්තධාතූන් වහන්සේ සටනේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. **(ලකුණු 04 යි)**
   (v) පළමුවන විමලධර්මසූරිය රජුගේ කාර්ය සාඵල්‍යය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. **(ලකුණු 07 යි)**

08. "**කෝල්බෲක්** - කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි."
   (i) කෝල්බෲක්-කැමරන් කොමිසම පත්කිරීමට තුඩුදුන් ප්‍රධාන සාධකය කුමක් ද? **(ලකුණු 01 යි)**
   (ii) එම කොමිසම විසින් යෝජනා කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් නම් කරන්න. **(ලකුණු 02 යි)**
   (iii) එම කොමිසම විසින් යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් නම් කරන්න. **(ලකුණු 02 යි)**
   (iv) සිවිල් සේවය සම්බන්ධයෙන් එම කොමිසම ඉදිරිපත් කරන ලද යෝජනා දෙකක් නම් කරන්න. **(ලකුණු 02 යි)**
   (v) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කළ ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 07 යි)**

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
   (i) දඹදෙණි යුගයේ සාහිත්‍යය (ii) ආර්ය චක්‍රවර්තීන් (iii) 19 වන සියවසේ ආගමික පුනරුදය
   (iv) අමද්‍යප ව්‍යාපාරය (v) සර්වජන ඡන්ද බලය
   **(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)**


10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කොට**, ඒවායින් ඕනෑම ස්ථාන **දෙකක**, ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) ඌව පළාත (ii) නල්ලූර් (iii) මහාතිත්ථ (iv) මඩකලපුව
   (v) මහනුවර (vi) යාපහුව (vii) යෝධ වැව (viii) වලවේ ගඟ
   **(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ප්‍රශ්න අංකය **10**

විභාග අංකය.......................................................



N

...................... පළාත් මායිම්
**Provincial Boundry**

WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library